**මුදල් මණ්ඩලය**

**ශ්‍රී ලංකා මහ බැංකුව**

2022 මාර්තු 18 | මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන විධාන | 2022 අංක 02

## ජංගම දුරකථන පදනම් කර ගත් විද්‍යුත් මුදල් සේවා

1. නෛතික ප්‍රතිපාදන

1.1 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 12 වන වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් ඔස්සේ ලබා ගන්නා ජංගම දුරකථන මත පදනම් වූ විද්‍යුත් මුදල් සේවා පිළිබඳ විධාන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබේ.

2. විධානයන්හි අරමුණ

2.1 රට පුරා පවතින බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ භෞතික ශාඛා ජාලය විසින් පාරිභෝගිකයන් සඳහා මූල්‍යමය සේවාවන් වෙත සීමිත ප්‍රවේශයක් පමණක් සලසනු ලබයි. එබැවින් පහසු මූල්‍ය ප්‍රවේශය සඳහා සක්‍රීය බැංකුකරණයට සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා විසඳුමක් වනු ඇත.

3. විධානයෙහි අදාළත්වය සහ විෂයපථය

3.1 මෙම විධානයන් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන 4.1 විධානයෙහි දක්වා ඇති ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්ට අදාළ විය යුතුය.

3.2 මෙම විධානයන් පහත විධානයන්ගේ අවශ්‍යතාවලින් නිදහස් කළ යුතුය.

අ) මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 07 දරන (ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිර සේවා ලබා ගැනීම) විධානයේ ‘2.1 අ’, ‘2.1 ඌ’ සහ ‘2.1 ඒ’ විධානය, සහ

ආ) මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 06 දරන (ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සහ මෙහෙයුම් කටයුතු) විධානයේ ‘6.2’ විධානය.

4. ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් ක්‍රමය ඔස්සේ අවසර ලබා දී ඇති සේවාවන්

4.1 බලපත්‍රලාභී සේවා සපයන්නන්ගේ සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ඔස්සේ බලපත්‍රලාභී මුදල් සමාගම්වලට පහත සේවා සිදු කර ගෙන යා හැකිය.

අ) තැන්පතු ලබා ගැනීම

ආ) තැන්පතු ආපසු ගැනීම

ඇ) ණය ප්‍රදානය කිරීම

ඈ) ණය ආපසු ගෙවීම් ලැබීම

ඉ) 4.1 අ) සිට ඈ) දක්වා වගන්ති සඳහා අදාළ වන ගාස්තු සහ වියදම්, සහ

ඊ) අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලබන පරිදි වෙනත් ඕනෑම කටයුත්තක්

5. බලපත්‍රලාභී මුදල් සමාගමේ වගකීම

5.1 අධ්‍යක්ෂ මණ්ඩලය

අ) ව්‍යාපාර උපායමාර්ගවලට අනුකූලව බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් සපයනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් පිළිබඳ උපායමාර්ග සම්පාදනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීම පැවරේ.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති, අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණයක් සහිතව සුදුසු ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුව, ප්‍රමාණවත් තාක්ෂණික සම්පත් සහ ස්වාධීන විගණනයට ලක් කරනු ලබන වෙළෙඳුන් මගින් ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්ට අදාළ උපායමාර්ග සඳහා සහාය විය යුතුය.

ඇ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා මගින් ඇති කරනු කරනු ලබන විභව අවදානම් පිළිබඳව අවබෝධ කර ගැනීම සහ ණය අවදානම, මෙහෙයුම් අවදානම, ද්‍රවශීලතා අවදානම, කීර්ති අවදානම, තාක්ෂණ අවදානම, නෛතික හා අනුකූලතා අවදානම ඇතුළුව අදාළ සියලු අවදානම් කළමනාකරණය කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි අවදානම් අවම වශයෙන් වාර්ෂික පදනමක් මත සමාලෝචනය කළ යුතුය.

5.2 ප්‍රධාන විධායක නිලධාරියා

අ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් ඔස්සේ ලබා ගත් ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්හි ජීව්‍යතාව, බලපත්‍රලාභී මුදල් සමාගම වෙත ඇති කරන අවදානම සහ එම සේවාවන් දිගින් දිගට ම ලබා ගැනීමේ තීරණය සම්බන්ධව දැනුවත් වීම පිළිබඳව තක්සේරු කිරීම

ආ) බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අවදානම් පැතිකඩ සමඟ අනුරූප වන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් සඳහා සීමා ව්‍යුහයන්වල (ගනුදෙනු සීමා, දිනයක සීමා, පාරිභෝගික සීමා, සේවා සපයන්නන්ගේ සීමා, වෙළෙඳුන්ගේ සීමා) නිසි තක්සේරුවක් සිදු කිරීම.

ඇ) අභ්‍යන්තර විගණන සහ බාහිර විගණන පැවැත්වීම මගින් පාලනවල ප්‍රමාණවත් බව තක්සේරු කිරීම.

ඈ) ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා පද්ධති සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.

ඉ) බලපත්‍රලාභී මුදල් සමාගම සහ බලපත්‍රලාභී සේවා සපයන්නන් අතර පවතින ගිවිසුමෙහි විධිවිධාන මෙම විධානයන්හි විධිවිධාන සමඟ අනුකූල වන බවට තහවුරු කිරීම.

6. අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දීම සහ යොමු කිරීම්

6.1 බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් ආරම්භ කිරීමක්, අත්හිටුවීමක් හෝ සිදු කරනු ලබන ඕනෑම සංශෝධනයකට පෙර බලපත්‍රලාභී මුදල් සමාගම විසින් අධ්‍යක්ෂවරයා දැනුවත් කළ යුතුය.

6.2 බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් ආරම්භ කිරීමට ප්‍රථම පහත දෑ අධ්‍යක්ෂවරයා වෙත යොමු කළ යුතුය.

අ) යෝජිත ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාව සඳහා බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අනුමැතිය

ආ) උපලේඛනය I හි දී ඇති ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවෙහි අවම අවශ්‍යතා සමඟ අනුකූල වීම සම්බන්ධව බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි තහවුරු කිරීමක්.

ඇ) උපලේඛනය II හි දී ඇති ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවෙහි අවම අවශ්‍යතා සමඟ අනුකූල වීම සම්බන්ධව බලපත්‍රලාභී මුදල් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ තහවුරු කිරීමක්.

ඈ) උපලේඛනය III හි දක්වා ඇති පරිදි ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවෙහි නිරත වී සිටින වෙළෙඳුන් පිළිබඳ විස්තර.

ඉ) උපලේඛනය IV හි දක්වා ඇති පරිදි ප්‍රධාන අවදානම් වර්ග සහ අවදානම අවම කිරීම් ඇතුළුව ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාව සහ එහි ව්‍යාපාරික බලපෑම් තක්සේරුව පිළිබඳ කෙටි වාර්තාවක්.

ඊ) අධ්‍යක්ෂවරයා හට අවශ්‍ය වන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවට අදාළ වෙනත් ඕනෑම තොරතුරක්.

7. ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව

7.1 බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්,මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 01 දරන (මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව) විධානයේ විධිවිධාන සමඟ අනුකූල වන බවට බලපත්‍රලාභී මුදල් සමාගම විසින් තහවුරු කළ යුතුය.

8. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය

8.1 අධ්‍යක්ෂවරයා විසින් බලපත්‍රලාභී මුදල් සමාගමක් මෙම විධානයන් සමඟ අනුකූල වන බවට නියාමනය කරනු ඇති අතර:

අ) අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම අවස්ථාවක බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්ට අදාළව ඕනෑම තොරතුරක් ඉල්ලීම.

ආ) අවශ්‍ය වන්නේ නම්, ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්හි නිරතව සිටින බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ පොත් සහ ස්ථාන පරීක්ෂා කිරීම.

ඇ) අවශ්‍ය යැයි සලකනු ලබන්නේ නම්, බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් බලපත්‍රලාභී මුදල් සමාගමකට සපයනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා සැකැස්ම නවතා දැමීමට සහ අත්හිටුවීමට නියෝග දීම.

ඈ) නිසි පරිදි බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ට එරෙහිව ඕනෑම ක්‍රියාමාර්ගයක් හෝ පියවරක් ගැනීමට බලපත්‍රලාභී මුදල් සමාගමකට නියෝග දීම.

ඉ) ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් මත බලපත්‍රලාභී සේවා සපයන්න් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ හැසිරීම හේතුවෙන් හට ගන්නා සිදුවීම් සඳහා ඕනෑම පිළියම් ක්‍රියාමාර්ගයක් ගැනීමට බලපත්‍රලාභී මුදල් සමාගමකට නියෝග දීම.

ඊ) බලපත්‍රලාභී මුදල් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුකූල නොවීමක් නිවැරදි කිරීම තහවුරු කරන තෙක් බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාව තාවකාලිකව අත්හිටුවීමට බලපත්‍රලාභී මුදල් සමාගමකට නියෝග දීම.

9. අනෙකුත් කොන්දේසි

9.1 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාව පවත්වා ගෙන යෑම සඳහා අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත විධානයන්ට පමණක් සීමා නොවී, ඒවා ද ඇතුළුව, විචක්ෂණ අවශ්‍යතාවන්ට අනුකූලව විය යුතුය.

9.2 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් සම්බන්ධව උපරිම ගනුදෙනු සීමා සහ ගාස්තු ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව හෝ අධ්‍යක්ෂවරයා විසින් පනවනු ලබන ගනුදෙනු සීමාවන් සහ ගාස්තු නොඉක්මවිය යුතුය.

9.3 බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් ලබා ගැනීම මෙම විධාන ක්‍රියාත්මක කිරීමට පෙර ආරම්භ කර ඇත්නම්, මෙම විධාන ක්‍රියාත්මක කිරීමෙන් මාස 6 ක් තුළ මෙම විධානවල අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු අතර, අනුකූලතාව සම්බන්ධව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතුය.

10. බලාත්මක වන දිනය

10.1 මෙම විධානයේ දිනයේ සිට මෙම විධානයන් බලාත්මක විය යුතුය.

11. අර්ථකථන

11.1 'අධ්‍යක්ෂවරයා' යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා යන්න අදහස් විය යුතුය.

11.2 'විද්‍යුත් මුදල්' යන්නෙන් මූල්‍ය වගකීම් ගෙවීමේ හෝ පියවීමේ ක්‍රමයක් ලෙස භාවිත කිරීමේ අරමුණ සඳහා ඉලෙක්ට්‍රොනිකමය වශයෙන් තැන්පත් කර තිබෙන, අරමුදල් ලැබීම මත නිකුත් කරනු ලබන මුදල්මය අගය යන්න අදහස් විය යුතුය.

11.3 'වෙළෙන්දා' යන්නෙන් ජංගම ගෙවීම් සේවා පවත්වා ගෙන යෑම සඳහා බලපත්‍රලාභී සේවා සපයන්නන් විසින් පත් කරන ලද ආයතන/ පුද්ගලයන් යන්න අදහස් විය යුතුය.

11.4 ‘බලපත්‍රලාභී සේවා සපයන්නා’ යන්නෙන් 2013 අංක 01 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම ගෙවීම් ක්‍රම රෙගුලාසි හෝ සංශෝධන ප්‍රකාරව බලපත්‍රලාභී සේවා සපයන්නෙකු යන්න අදහස් විය යුතුය.

**නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්**
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

**උපලේඛනය I**

**අධ්‍යක්ෂ මණ්ඩලයේ තහවුරු කිරීම**

බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවන්ට අදාළව අවම වශයෙන් පහත අවශ්‍යතා බලපත්‍රලාභී මුදල් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ තහවුරු කිරීම මඟින් ආවරණය කළ යුතුය.

අ) ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් සම්බන්ධව වන මෙම විධානයන්ට අනුකූල වීම සහ පිළිපැදීම.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද,

i. බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් තෝරා ගැනීමේ ප්‍රතිපත්තිය
ii. අවදානම් කළමනාකරණ රාමුව
iii. පාරිභෝගික ආරක්ෂණ යාන්ත්‍රණය
iv. ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා කළමනාකරණය, පාලනය සහ අධීක්ෂණ යාන්ත්‍රණය;
සහ
v. මෙහෙයුම් කාර්ය පටිපාටි සහ සංග්‍රහයයන්

ට අනුකූල වීම සහ පිළිපැදීම

ඇ) බලපත්‍රලාභී මුදල් සමාගම් සහ බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් සමඟ ගිවිස ගෙන ඇති එකඟතාවයෙහි අවශ්‍ය ප්‍රතිපාදන පැවතීම සහ මෙම විධානයන් සමඟ එවැනි ප්‍රතිපාදන අනුකූල වීම

ඈ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් 2013 අංක 01 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම ගෙවීම් ක්‍රම රෙගුලාසි හෝ සංශෝධන සමඟ හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ඕනෑම රෙගුලාසියක් සමඟ අනුකූල වන බවට තහවුරු කිරීම.

ඉ) බලපත්‍රලාභී මුදල් සමාගම්වල ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් සම්පත් සහ ප්‍රවීණතාව පැවතීම.

ඊ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා ආශ්‍රිත සියලු අවදානම් හඳුනා ගැනීම, ලේඛනගත කිරීම සහ එම අවදානම් අවම කිරීමට හෝ පැවරීමට නිසි පියවර ගැනීම.

උ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් සපයනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් භාවිතයෙන් පාරිභෝගික ආරක්ෂාව සඳහා පැමිණිලි විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග සහ සහන ක්‍රමවේදය සඳහා පද්ධති සහ ක්‍රියා පටිපාටි ස්ථාපිත කර ඇත.

ඌ) බලපත්‍රලාභී සේවා සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා අඛණ්ඩව නිරීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන, පද්ධති සහ පිරිස් පවත්වා ගැනීම සහ බලපත්‍රලාභී සේවා සහ ඔවුන්ගේ වෙළෙඳුන්ට නියම කර ඇති වගකීම්වලට අනුකූල නොවන අවස්ථා විසඳීම හෝ මඟ හැරීම් සඳහා පිළියම් යෙදීම සඳහා ප්‍රමාණවත් අධීක්ෂණයක් පැවතීම.

එ) 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතෙහි විධිවිධාන සහ ඒ යටතේ දක්වා ඇති මුදල් විශුද්ධීකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ කටයුතු වැළැක්වීම සඳහා පවතින රීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශයන්හි වන නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම.

ඒ) බලපත්‍රලාභී මුදල් සමාගම් ගනුදෙනුකරුවන්ගේ තොරතුරුවල ආරක්ෂාව සහ ඒවායෙහි රහස්‍යභාවය පවත්වා ගෙන යෑම තහවුරු කිරීම සඳහා පද්ධති සහ ක්‍රියාවලි පිහිටුවීම.

ඓ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් සපයනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් බාධාවකින් තොරව සැපයීම තහවුරු කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් පැවතීම.

ඔ) පහත අවම නිර්ණායකය මත ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාව ආරම්භ කිරීමට පෙර බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ යෝග්‍යතාව තක්සේරු කිරීම.

i. ව්‍යාපාරික හැසිරීමේ දී විශ්වසනීයත්වය සහ වෘත්තීමය ප්‍රමිති නිරූපණය කිරීම.
ii. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම, වාර්තා පවත්වා ගෙන යෑම, අභ්‍යන්තර පාලන සහ පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාමාර්ග සාර්ථකව ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් සම්පත් සතු වීම
iii. කිසිදු නීති විරෝධී /සදාචාරාත්මක නොවන කටයුත්තක නියැළී නොසිටීම.
iv. උසස් තත්ත්වයෙන් යුත් ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් සැපයීමට දැනුම සහ නිපුණත්වය සතු වීම.
v. ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් ගනුදෙනු හා ආශ්‍රිත සියලු අවදානම් පාලනය කිරීමේ හැකියාව නිරූපණය කිරීම.

**උපලේඛනය II**

**ප්‍රධාන විධායක නිලධාරියාගේ තහවුරු කිරීම**

බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවන්ට අදාළව අවම වශයෙන් පහත අවශ්‍යතා බලපත්‍රලාභී මුදල් සමාගමක ප්‍රධාන විධායක නිලධාරියාගේ තහවුරු කිරීම මඟින් ආවරණය කළ යුතුය.

අ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්වල ගනුදෙනුකරුවන් වෙත පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවෙහි භාවිතය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ඔස්සේ පැහැදිලි, අවබෝධිත සහ ලේඛනගත තීරණ ගැනීම.

ආ) බලපත්‍රලාභී මුදල් සමාගම විසින් එම සමාගමේ ප්‍රතිලාභී ගිණුම්හිමියා වෙත එවනු ලබන කෙටි පණිවුඩයක් සහ/ හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් ඔස්සේ තත් කාලීන පදනමක් මත ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් ගනුදෙනුව පිළිබඳව දැනුම් දිය යුතුය.

ඇ) බලපත්‍රලාභී මුදල් සමාගම්වල මෙහෙයුම් අත්පොත්වල පිළිබිඹු කර ඇති පරිදි බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා ක්‍රියා පටිපාටි පැවතීම.

ඈ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා බලපත්‍රලාභී සේවා සපයන්නන්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ බලපත්‍රලාභී මුදල් සමාගමේ ගනුදෙනුකරුගේ ගිණුම සමඟ සැසඳෙන්නේ ද යන්න සහතික කිරීමට පද්ධති සහ ක්‍රියාවලීන් පැවතීම.

ඉ) නම, දුරකථන අංකය, භෞතික ස්ථානය/ ලිපිනය ඇතුළුව ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාව ඇතුළුව බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ යාවත්කාලීන ලැයිස්තුව/ දත්ත සමුදාය පවත්වා ගෙන යෑම.

ඊ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ට අභ්‍යන්තර සහ බාහිර තර්ජනවලින් තොරතුරු ආරක්ෂා කර ගැනීමට නිසි ආරක්ෂාකාරී පාලන ඔවුන් සතුව පවතින බවට තහවුරු කිරීම.

උ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවන්ට අදාළව පැමිණිලි සහ දුක්ගැනවිලි යොමු කිරීම සඳහා ගනුදෙනුකරුවන් සඳහා ම වෙන්කළ ක්ෂණික දුරකථන අංකයක් පැවතීම.

**උපලේඛනය III**

බලපත්‍රලාභී සේවා සපයන්නන් හා සම්බන්ධිත වෙළෙඳුන්ගේ විස්තර (එහෙත් පහත ඒවාට පමණක් සීමා නොවේ)

අ) වෙළෙන්දාගේ නම

ආ) ව්‍යාපාර ලියාපදිංචි අංකය

ඇ) ලියාපදිංචි ලිපිනය සහ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු (ලියාපදිංචි ලිපිනයෙන් වෙනස් වන්නේ නම් තැපැල් ලිපිනය ද ඇතුළුව)

ඈ) ප්‍රධාන ව්‍යාපාර කටයුතු

ඉ) මූල්‍ය අඛණ්ඩතාව

**උපලේඛනය IV**

බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවා පිළිබඳ කෙටි ශක්‍යතා වාර්තාවක්

අ) ව්‍යාපාර යෝජනාවේ විෂයපථය

ආ) අදාළ වන පාර්ශ්ව

ඇ) පිරිවැය/ ප්‍රතිලාභ විශ්ලේෂණය

ඈ) ගනුදෙනුකරුවන්ගෙන් අය කරන ගාස්තු/ වියදම්